ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018 නොවැම්බර් මස 07 වැනි දින |

## "A Step by Step Guide to Doing Business in Sri Lanka" ප්‍රකාශනය - 2018




" A Step by Step Guide to Doing Business in Sri Lanka " ප්‍රකාශනයේ අටවන සංස්කරණය පොදු මහජන පරිශීලනය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දැන් නිකුත් කර ඇති අතර 'ව්‍යාපාරයක් ආරම්භ කිරීම', 'ව්‍යාපාරයක් තුළ' සහ 'වෙනත් ක්‍රියාකාරකම්' යන ප්‍රධාන පරිච්ඡේද තුන යටතේ වර්ගීකරණය කර ඇති මෙම ප්‍රකාශනය ව්‍යාපාරික ප්‍රජාව, විදේශීය ආයෝජකයින්, ව්‍යවසායකත්ව හැකියාවෙන් යුත් පුද්ගලයින් සහ ආයෝජන ප්‍රවර්ධන ආයතන සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු වලින් සමන්විත වේ. එක් එක් මාතෘකාව යටතේ අදාළ ආයතන, ලේඛන අවශ්‍යතා, නියාමන නිෂ්කාශන සහ අදාළ වියදම් පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු අන්තර්ගත වේ. තවද, මෙම ප්‍රකාශනය සඳහා 2018 මැද භාගය වනතෙක් අදාළ ආයතන වලින් ලබා ගත් සංශෝධන ඇතුළත් කොට තිබේ.

මෙම ප්‍රකාශනය සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල (චැතැම් වීදිය, කොළඹ 01), බැංකු විදු පියෙස ( අංක 58, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය ) සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර, මාතලේ, නුවරඑළිය, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය සහ අනුරාධපුරයෙහි පිහිටි ප්‍රාදේශීය කාර්යාලවල බෙදාහැරීම් කවුළු වලින් මිල දී ගත හැකිය. තවද මෙහි විද්‍යුත් පිටපත ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් (http://www.cbsl.gov.lk) ලබා ගත හැක.